## සන්නසට ස්තූතියි

තෙරුවන් සරණයි !

සන්නස සංස්කාරකතුමා වෙත,

ඔබ පුවත්පත මගින් මා වෙත එවනු ලැබූ පරිගණකය මා වෙත ලැබුණා. මේ මොහොතේ මාගේ සිතෙහි ඇතිවන ප්‍රීතිය වචනවලින් කියන්නට බැරි තරම්.

ජීවිතයේ දුෂ්කරම හා තීරණාත්මක මොහොතක සිටි මාගේ තොරතුරු "සන්නස" පුවත්පතේ පළ කිරීම සම්බන්ධයෙන් ප්‍රථමයෙන් ඔබතුමාට ස්තූතිය පුද කරමි. මාගේ තොරතුරු පළවීමත් සමග මහත්ම මහත්මීන් කිහිපදෙනෙකුගෙන්ම මට ආධාර උපකාර ලැබුණි. මාගේ අධ්‍යාපන කටයුතු සහ අනාගතය සාර්ථක කර ගැනීම සඳහා ඒ සියල්ල විශාල පිටිවහලක් බව සතුටින් දන්වා සිටිමි. පවතින ආර්ථික දුෂ්කරතා හේතුවෙන් අධ්‍යාපන කටයුතු අතැහැර දැමීමට සිතා සිටි මා හට සන්නස පුවත්පත නවමු බලාපොරොත්තු ඇති කළා. අද මම පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ කලා පීඨයේ ප්‍රථම වසර අධ්‍යාපන කටයුතු හදාරන ශිෂ්‍යාවක්මි. මාගේ මේ ගමනට දිරි දුන් "සන්නස" පුවත් පතේ ඔබ ඇතුළු කාර්ය මණ්ඩලයට ස්තූතිය පුද කරමි.

අද මම පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ සතුටින් අධ්‍යාපන කටයුතු හදාරන්නේ "සන්නස" පුවත්පතෙන් මා හට කළ උපකාර හේතුවෙන්ය. මා වැනි දුප්පත් අසරණ සිසුන් වෙනුවෙන් මෙවන් සද්කාර්යයන් කිරීමට ඔබ ඇතුළු සන්නස පුවත්පතේ කාර්යය මණ්ඩලයට ශක්තිය ධෛර්යය ලැබේවායි ඉත සිතින් ප්‍රාර්ථනා කරමි.

මීට
විශ්වාසී
**සමුද්‍රිකා**

---

**මෙම සද්කාර්යයට සහය දුන් දීපාල් /කාංචනා ගුණවර්ධන ඇතුළු සියලු පරිත්‍යාගශීලීන්ටත් සම්බන්ධීකරණය කළ ශ්‍රීලාල් සෙනෙවිරත්න සොයුරාටත් ට්‍රාන්ස්කෝ කාගෝ ආයතනයටත් අපේ ස්තූතිය හිමිවෙයි**

**සංස්කාරක - සන්නස**








